# "හෙළ හඬ- සමග අපේ උරුමය" ජාත්‍යන්තරයට ගෙන යන සහන් රන්වල ගේ ප්‍රසාංගික වේදිකා දැක්ම "ගම අවුලක්ද්‍ක්‍දං" මෙල්බන් රසික සහෘදයන්ට මැයි 31 බිසන් සෙන්ටර් හිදි සවස 3.00ට සහ 6.30ට..

සහන් රන්වල හුදෙක් කලාශිල්පියෙකු පමණක් නොව වෘත්තියෙන් නිතීඥයෙක්, රූපවාහිනි වැඩසටහන් නිෂ්පාදකවරයෙක්, රූපවාහිනි ගුවන්විදුලි වැඩසටහන් මෙහෙයවන්නෙක් ඒ සමග අපේකම අපේහඬ ගම් නියම්ගම් වලින් ඔබ්බට ජාත්‍යන්තර තලයට රැගෙන යමින් විශාල නිහඬ සේවයක් කරන වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම කලාශිල්පියෙක්. එමෙන්ම පියානන් වන ලයනල් රන්වලයන්ගේ හදිසි අභාවයෙන් පසු එතුමා මහත් පරිශ්‍රමයකින් ගොඩ නගාගත් ප්‍රසංගික කලාව නැවතත් අභාවයට යන්ට නොදී ඉදිරියට රැගෙන යන ඇප කැප වන ශිල්පයෙක් එමෙන්ම එය ඉදිරියට රැගෙන යන්නට පරම පවිත්‍ර චේතනාවෙන් අපේ ළමුන්ගේ සිට වැඩිහිටියන් දක්වා පුහුණු කරන ශිල්පියෙක්. ඉතින් එවැනි විශාල වැඩ කොටසක් කරමින් සිටින සහන් අපේ පුරවරයට එනම් මෙල්බන් පුරවරයට එනවා මැයි 31 වෙනිදා අපි එදිනට ඔහු ඉදිරිපත් කරන ප්‍රසංගය පිළිබඳව තොරතුරු බිඳක් විමසමු.

**ශ්‍රීනාත් -**
සහන් ප්‍රසංගය ගැන විමසන්න ඉස්සෙල්ලා මම කැමතියි මේ අපේකම ඉදිරියට රැගෙන යන මේ අභියෝගයට මුහුණ දෙන්නේ කොහොමද?




**සහන් -**
මම හරි සතුටුයි වෙන අය මේ ගැන දකින පැත්තට වඩා ඔබ අභියෝගය ලෙස මෙය දැකීම...බොහෝ අය මෙය අභියෝගයක් කියලා හිතන්නේ නෑ...මොකද බොහෝ අය අපේ හඬ පාවිච්චි කරන්නේ මොකක් හරි ජාත්‍යන්තර සංගීත ප්‍රසංගයකට සහභාගිවන කොට...නමුත් මේ ගැන හරි අවබෝධයකින් හරි ඉගෙනගැනීමකින් නෙමෙයි. ඉතින් අපිට වැඩිපුරම අභියෝගය තියෙන්නේ මේ අපේ ජන සංගිතය ජන හඬ විකෘති කරන අයගෙන්....ඔවුන් එය විකෘති කරනවා පමණක් නෙවෙයි, ඔවුන් සොයා ගත් දෙයක් ලෙස සමාජ ගත කරනවා. අපි හරි දේ ඉදිරිපත් කරන කොට හිතන්නේ ඒ අයගේ දේ අපි ඉදිරිපත් කරනවා කියලා. ඉතින් මේ හරි දේ සමාජ ගත කරන එක තමයි මට තියෙන විශාල අභියෝගය.....නමුත් අපේ ප්‍රයන්තයෙන් දැන් ටිකෙන් ටික සමාජය තේරුම් අරන් තියෙනවා ඒ නිසා තමයි අපට ලෝකයේ විවිධ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ගෙන් අපට ආරාධනා ලැබෙන්නේ. එහි එක් ප්‍රතිඵලයක් තමයි ඔබ මුණගැහෙන්න එන ඕස්ට්‍රේලියානු සංචාරය.

**ශ්‍රීනාත් -**
"අපේ හඬ"," අපේ සංගීතය" ජාත්‍යන්තරය පිළිගන්නේ කොයි ආකාරයටද?

**සහන් -**
ලෝකයේ ඕනෑම රටකට අනන්‍යතාවක් තියෙනවා. ඔවුන්ගේ සංකෘතියක් තියෙනවා. ඔවුන්ට කියලා ලෝකයට ඉදිරිපත් කරන්න දෙයක් තියෙනවා....අපිට ඉදිරිපත් කරන්න තියෙන්නේ අපේම කියලා බය නැතුව කියන්න පුළුවන් අපේ ජන ගී අපේ ජනතාව ඒ වගේම අපේ සම්ප්‍රදායික උඩරට, පහතරට, සබරගමු, කියන අපේ නර්තන ශිල්ප....ඒක තමයි අපේ ආවේනික හඬ අපේ නැටුම......... ඒ නිසා ඕනෑම රටකට ගියාම ඔහුන් අපේකම හඳුනාගන්නවා. ඒ එක්කම සම්ප්‍රදායන් රැකගෙන අපි නිර්මානාත්මකව එය ඉදිරිපත් කරනවා. ඒ නිසා තමයි අපිට පසුගිය අවුරුද්දේ චීනයේදී ජාත්‍යන්තර සම්මානයට පවා පාත්‍රවුනේ....

**ශ්‍රීනාත් -**
කොහොමද මේ මෙල්බන් ප්‍රසංගය එළි දැක්වෙන්නේ......

**සහන් -**
මේ ප්‍රසංග අපි ඉදිරිපත් කරන්නේ ජාත්‍යන්තරයට අවශය ආකාරයට ..... නව තාක්ෂණික මෙවලම් උපයෝගි කරගෙන අපේ කලාවේ තිබෙන ප්‍රසංගිකභව අපි ප්‍රේෂකයන්ට පෙන්වනවා.... බාලයාගේ සිට වැඩිහිටියා දක්වා රස විදිය හැකි ආකාරයට අපි ඉදිරිපත් කරන්නේ ළමුන් යොදා ගෙන කරන නිර්මාණයක උනත් අපි කරන්නේ වැඩිහිටියන්ටත් යමක් ලබාගන්න පුළුවන් නිර්මාණයක්......




බලයාගේ සිට වැඩිහිටියා දක්වා කිවුවාම හැම වයසක්ම අහුවෙනවා .....නේද ශ්‍රීනාත්......මම කියන්න කැමතියි අපි ප්‍රසංගයේදී වැඩි බරක් අපේ තරුණ තරුණියන්ට දෙන්න උත්සාහ කරනවා විශේෂයෙන්........විදේශ වල ජීවත් වන තරුණ තරුණියන්ගේ සිතුම් පැතුම් අපි හඳුනනවා....ඒවා තේරුම් බේරුම් කරගෙන ඔවුන් ඉලක්ක කරගත් නිර්මාණ රාශියක් අපි ඉදිරිපත් කරනවා....බොහෝ ජනප්‍රිය සංගීත රටාවලට නෑකම් කියන අපේ හඬවල් අපේ ගීයේ







තියෙනවා. ඒවා අපි ඔවුන්ට ඉදිරිපත් කරනවා. ......ඒ නිසාම තමයි අපේ අපේ ප්‍රසංගයට ප්‍රසංගික බව වැඩි කරලා තියෙන්නේ....එයින් අදහස් වෙන්නේ නෑ බාලයන්ටයි වැඩිහිටියන්ටයි රසවිදින්ට බැහැයි කියන එක නෙමෙයි......වැඩිහිටියන්ට හුගක් හොදට දැනෙයි අපේ හඬ මේ දැන් තරුණ තරුණියන් ඉතා ඕනෑකමින් අහන්න සමත් බව හරි ගිත සම්ප්‍රදායක් අපේ සංගීත කාලාවේ තියෙනවා නේද කියලා ඒ අයට කියලා දෙන්න පුළුවන්. ඒ අයගේ මතකය අළුත් වෙවී............

**ශ්‍රීනාත් -**
ඔව්, ඒක ඇත්ත. ප්‍රසංගය නරඹනකල් ඒ ගැන වැඩියමක් අපට කියන්න බෑ......

**සහන් -**
ඔව් ශ්‍රීනාත් ...........ඒක තමයි අපි ඉදිරිපත් කරන ප්‍රසංගයේ තිබෙන විශේෂත්වය දරුනැලවිල්ලේ සිට නුතන සංගීත සම්ප්‍රදායන් දක්වා අපේ ප්‍රසංගය පෙළ ගැස්සෙනවා.

**ශ්‍රීනාත් -**
හොඳයි සහන්....අපට කියන්න අවසාන වශයෙන් ඔබට කුමක්ද කියන්න තියෙන්නේ.

**සහන් -**
මම කියන්න කැමතියි, මම හිතන්නේ අපි චීන සංචාරයෙන් පස්සේ වැඩිම අපේ පිරිසක් සහභාගිවෙන ප්‍රසංගය තමයි මෙල්බන් ප්‍රසංගය. ඉතින් මම හැමදෙනාටම කියන්නේ.. අපේ අය 12කට නොවැඩි පිරිසක් සහභාගිවෙනවා. මේ අපූරු ප්‍රසංගය එසේත් නැත්නම් ප්‍රසංගයකට වඩා ඔබ්බට ගිය මේ අපේ වෑයම අපේකමට ආදරය කරන හැමෝටම ඇවිත් අපිත් සමග එකතුවෙන්න...ඒ වගේම මේ භාරදූරය කාර්යට උර දුන්න ලක් මැදුර පදනමේ සියළු දෙනාටම මගේ අවංක ආදරය ගෞරවය පිරිනමනවා......

**ශ්‍රීනාත් -**
එහෙම නම් අපි මැයි 31 වෙනිදා බිසන් සෙන්ටර් හිදි හමුවෙමු....... ඒ වගේම ලක් මැදුර පදනමේ සියළුම සමාජික මහත්වරුන්ට සන්නස වෙනුවෙන් අපි ස්තුතිවන්ත වෙනවා...මෙවන් විශාල පිරිවැයක් දරා මෙවැනි ප්‍රසංගය මෙල්බන් ජනතාවට පෙන්වන්න උත්සාහ දැරීම පිළිබඳව එයින් පෙනෙනවා. ඔවුන්ගේ සිත්වල තිබෙන අපේකමට ඇති කැමැත්ත සහ ගෞරවය. මම නැවත වරක් ඔවුන්ට ස්තුතිවන්ත වෙමින් සියළුදෙනාටම ආරාධනා කරනවා ළමා ළපටින් සමග පැමිණ මේ අපූරු ප්‍රසංගය නරඹා යමක් ගෙදර අරන් යන ලෙසට.


